**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2022**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්ථයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන

### 1.5.1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවීම් වවුචර ගිණුම්ගත කරන අවස්ථාවේදීම අදාළ වියදම නිවැරදිව වර්ගීකරණය කර ගිනුම්ගත කිරීම වෙනුවට, කාර්යාල උපකරණ හා, යන්ත්‍රෝපකරණ අමතර කොටස් වැනි වත්කම් මිලදී ගැණීම, අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැණීම, සුභ සාධන හා ගොඩනැගිලි නඩත්තු ද්‍රව්‍ය මිලදී ගැණීම යනාදිය සඳහා වර්ෂය පුරා දරන ලද රු.59,857,724ක වියදම් ලිපිද්‍රව්‍ය ගිණුමට හර කර වර්ෂ අවසානයේදී ජර්නල් සටහන් මඟින් අදාළ ගිණුම් වලට මාරු කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු නිවැරදි බව හා 2024 ජනවාරි 01 දින සිට ලිපි ද්‍රව්‍ය ගබඩාව හා යන්ත්‍ර අමතර කොටස් ගබඩාව පරිගණක පැකේජයේ වෙන් වෙන්ව පවත්වා ගෙන යාමට ගබඩා භාරකරුට උපදෙස් ලබා දී ඇති බව. | වියදම් විෂයයන් හඳුනාගත හැකි ආකාරයේ සංකේත අංකන ක්‍රමයක් භාවිතාකර, ගෙවීම් වවුචරය පිළියෙල කරන අවස්ථාවේදීම අදාළ වියදම නිවැරදිව වර්ගීකරණය කර ගිනුම්ගත කිරීම සඳහා අවශ්‍ය පාලන ක්‍රම ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට බැංකු සැසඳුම්වල දක්වා තිබුණු රු. 224, 168 ක්ද ඇතුළුව බැංකු ගිණුම් 02 කට සෘජුවම ලැබී තිබුණු වර්ෂයකටත් වඩා පැරණි රු. 2,282,675 ක් වූ මුදල් හා චෙක්පත් නිශ්චිතව හඳුනාගෙන පොත්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගත හැකි සෘජුවම බැංකුවට ලද ශේෂයන් හඳුනාගැනීමටත් ඉතිරිය වෙනත් ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමටත් ඉදිරියේදී කටයුතු කරන බව. | 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර නිවැරැදි කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල වැරදි නිවැරදි කිරිමට, ගැලපුම් සිදු කිරිමට හා අත්තිකාරම් පියවීමට පිළියෙල කර තිබුණු එකතුව රු.2,090,700,289ක්වූ ජර්නල් වවුචර් 1438ක් වගකිවයුතු නිලධාරියකු විසින් පරික්ෂාකර බලා අනුමත කර නොතිබුණි. තවද, පරිගණකගත කරන ලද එකතුව රු.151,744,869 ක්වූ ජර්නල් සටහන් 36ක් පසුව අවලංගු කර තිබුණද එම ජර්නල් වවුචර්ද පිළියෙල කිරීමේදී මෙන්ම අවලංගුකිරීමේදී වගකිවයුතු නිලධාරියකු විසින් අනුමත කර නොතිබුණු අතර අවලංගු කළ බවට කිසිදු සටහනක් ජර්නල් වවුචරය මත තබා නොතිබුණි. | නිරීක්ෂණයට එකගවන බව හා එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර නිවැරැදි කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව විදුලිය බෙදා හැරිමේ පද්ධතියට අදාල ක්‍රමක්ෂය රු.1,148,002ක්, ගොඩනැගිලි ක්ෂය රු.916,212ක් හා වාහන ක්ෂය රු.196,395ක් අඩුවෙන්ද ඉන්වෙන්ට්‍රි අයිතම ක්ෂය රු.25,891ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ ක්ෂය හා ක්‍රමක්ෂය ගිණුම්ගත කිරිමට අදාළ ජර්නල් වවුචරය පිළියෙල කිරිමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | නිරීක්ෂණයට එකගවන බව හා එය නිවැරදි කිරිමට කටයුතු කරන බව. | 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරිමට පෙර නිවැරැදි කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු නිෂ්පාදන ගිණුමට අනුව නිෂ්පාදන පිරිවැය රු.726,151,032ක් වුවද, ඒකක නිෂ්පාදන පිරිවැය මත කාර්තු පදනමෙන් පිළියෙල කර තිබුණු නිෂ්පාදන පිරිවැය වාර්තා අනුව මුළු නිෂ්පාදන පිරිවැය රු.495,632,070ක් වූයෙන් වෙනස රු.230,518,961ක් විය. මෙම පිරිවැය විචලනයන් පරික්ෂාකර අදාළ ගැලැපීම් සිදු කිරිමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව පවතින විෂමතාවයන් පිළිබඳව අවධානය යොමුකර නිවැරදිව ගිණුම් තොරතුරු යාවත්කාලීන කිරීමට පියවර ගන්නා බව. | නිෂ්පාදන ගිණුම අනුව හඳුනාගන්නා සත්‍ය නිෂ්පාදන පිරිවැය මුළු නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව විසින් අන්තර්ග්‍රහනය කර ඇති සේ සලකා ඒ මත පදනම්ව ඒකකයක නිෂ්පාදන පිරිවැය තීරණය කළ යුතුය. මෙම පිරිවැය විචලනයන් පරික්ෂාකර අදාළ ගැලැපීම් කිරිමට කටයුතු කළයුතුය. |

### 1.5.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු නොකිරිම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | |
| | (i) | ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, රජයේ ප්‍රදාන වශයෙන් සමාලෝචිත වර්ෂය දක්වා ලැබී තිබුණු එකතුව රු304,227,234 ක්වූ ස්ථාවර වත්කම්වලට අදාළ රු.19,487,730 ක්වූ සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ප්‍රමාණය විලම්භිත අදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ මුළු ක්ෂය වෙන්කිරිම් ප්‍රමාණය වූ රු.57,091,291 කට ක්‍රමක්ෂය ප්‍රමාණය හිලව් කර ශුද්ධ වෙනස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විමසුම හා එකඟවන බව හා 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපලට හඳුන්වාදීමේ හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2015 මැයි 26 දින රු.15,000,000 ක ප්‍රදානයක් සංස්ථාවට ලබා දී තිබුණු නමුත් මෙම මුදල් ප්‍රදානය ප්‍රමිතයේ 88 ඡේදය ප්‍රකාරව ආදායමක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ජංගම වගකීමක් නිරූපනය වී තිබුණි. | ආයතනයේ පවතින තොරතුරු අනුව මෙම රුපියල් මිලියන 15 නැවත ගෙවිය යුතු වගකීමක්ද නොඑසේනම් ප්‍රදානයක්ද යන්න තහවුරු කළ නොහැකි බැවින් ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කර ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) පහත සඳහන් නිරීක්ෂණවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉතිරි තොගවල අගය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට අනුකූලව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (i) සංස්ථාවේ ගබඩා 03 ක සහ දිවයින පුරා පිහිටි ඖෂධ අලෙවිසැල් 17 ක පැවැති නිමි තොග සම්බන්ධයෙන් ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව, ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට තොග ලෙජර පවත්වා තිබුණද එම තොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තීරු යාවත්කාලීන කර නොතිබුණි. ප්‍රමිතයේ 27 හා 28 ඡේද ප්‍රකාරව තොග ලෙජර නිවැරදිව පවත්වා ගෙන යාමෙන් නිරායාසයෙන් ලැබෙන ඉතිරි තොග අගය ශුද්ධ උපලබ්ධි අගය සමඟ සසඳා ඉන් අඩු අගය වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීම වෙනුවට තොග ලෙජරයේ ඉතිරි ඒකක සංඛ්‍යාව ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැයකින් වැඩිකර 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ අගය රු.177,928,072 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි. තවද, නිමි ඖෂධ තොග ලෙජර ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට පවත්වා තිබුණු නමුත් ඉතිරි නිමි ඖෂධ | මෙම ගැටළු මඟ හරවා ගැනීම සඳහා සියලු අලෙවි මධ්‍යස්ථාන ජාල ගත කරමින් නව පරිගණක පැකේජයක් හඳුන්වා දීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව හා ඉදිරියේදී මෙම ගැටළු පැන නොනගිනු ඇති බව. | ප්‍රමිතය ප්‍රකාරව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමය හෝ භරිත සාමාන්‍ය ක්‍රමය යන පිරිවැය සූත්‍ර වලින් එකක් අඛණ්ඩව අනුගමනය කරමින් තොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තීරු යාවත්කාලීන කළ යුතු අතර ඒ මත පදනම්ව නිකුත් කරන තොගවල පිරිවැය හා වර්ෂය අවසන් ඉතිරි තොගයේ පිරිවැය ගණනය කර ගිණුම්ගත කළ යුතුය. පරිගණක නොමැති අංශවල තොග ලෙජර පොත් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තොග හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය පදනම් කරගෙන ගණනය කර ගිණුම්ගත කළ බවට වූ සාවද්‍ය ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර තිබුණි. | | |
| (ii) | ගිණුම්ගත කර තිබුණු රු.96,125,058 ක් වූ අමුද්‍රව්‍ය තොගය, රු.177,928,072 ක් වූ නිමි ද්‍රව්‍ය තොගය හා රු.39,356,268 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය තොගය යන තොග සම්බන්ධයෙන් භෞතික තොග ආගණනය කරන කාල සීමාව තුළ තොග සංචලන ක්‍රියා අත්හිටුවීමට හෝ මෙහෙයුම් ක්‍රියාවලියේදී උක්ත කාල සීමාව තුළ සංචලනය විය හැකි තොග ප්‍රමාණය ඇස්තමේන්තු පදනම මත වෙන්කර තැබීමට හෝ කටයුතු කර නොතිබුණු අතර සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වාගෙන යන අතර තුර භෞතික තොග ආගණන කටයුතුද සිදුකර තිබුණි. ඒ අනුව එක් එක් භාණ්ඩයට අදාල භෞතික තොග ආගණන කාලසීමාව තුළ තොග ලැබීම් හා නිකුත් කිරීම් භෞතික තොග සමීක්ෂණ වාර්තාවල ශේෂයන්ට ගැලපිය යුතු වුවද එසේ සිදුකළ බවට සාක්ෂි නොතිබුණි. | වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සිදු කරන කාලය තුළදී භාණ්ඩ නිකුත් කිරීම සහ භාර ගැනීම් සිදු නොකිරීමට 2023 වර්ෂයේ සිට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | තොග ආගණනයේදී රු.1,294.13 ක් වූ මිලිලීටර් 750 කැඩුම් බිඳුම් තෙල් බෝතලයක ඒකක පිරිවැය රු.129,413ක් ලෙස දැක්වීම හේතුවෙන් බෝතල් 203 ක පිරිවැය රු.26,008,131කින්ද, මිලි ලීටර් 100 මී පැණි බෝතල් 9665 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් රු.1,609,264 කින්ද, භාෂ්කර ලවන කිලෝග්‍රෑම් 1098 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් රු.1,034,847 කින්ද, අමුද්‍රව්‍ය ගබඩාවේ නොතිබුණු ඖෂධ 03 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් රු.120,508 කින්ද වශයෙන් රු.28,772,750 කින් | නිරීක්ෂණයට එකඟවන බව හා මෙම කරුණු 2023 ගිණුම් වර්ෂයේ නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අවසන් තොගය වැඩියෙන් දක්වා තිබුණු අතර නාවින්න අලෙවි සැලේ පැවැති නිෂ්පාදන 189 කට අයත් ඒකක 8673 ක් තොග ආගණනයේදී අතහැරීම හේතුවෙන් රු.1,975,542 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (iv) වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව ගබඩා අංක 14හි පැවැති භාවිතයට ගත හැකි ගොඩනැගිලි ද්‍රව්‍ය, විදුලි උපකරණ හා උපාංග, යන්ත්‍ර උපකරණ අමතර කොටස්, ජලනල උපාංග හා වෙනත් ද්‍රව්‍ය වර්ග 284කින් ඒකක 2234 ක් හා භාවිතයට ගත නොහැකි ඒකක 285ක්ද තොග ගිණුම්ගත කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | විමසුම හා එකඟවන බව හා පරිගණක පැකේජයේ තොග වටිනාකම රහිතව ප්‍රමාණයන් ගෙන් පවතින බැවින් එම තොරතුරු නිවැරදිව ගිණුම්ගත කිරීමට අදාළ ගබඩා නිලධාරීන් හා භාරකරුවන් වෙත උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු නොකිරිම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ වසා දැමුණු ස්ථාවර තැන්පතු 07 ක දළ මුදල් ලැබීම් රු. 254,054,982 ක් හා අලුතින් ආරම්භ කළ ස්ථාවර තැන්පතු 05ක රු.175,000,000 ක්වූ මුදල් යෙදවීම් යථෝක්ත ප්‍රමිතයේ 21 ජේදය ප්‍රකාරව වෙන වෙනම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වාර්තා කර ලැබිය යුතු පොලිය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම වෙනුවට ශුද්ධ පදනම මත මුදල් ගලා ඒමක් ලෙස වාර්තා කර තිබුණි. | නිරීක්ෂණයට එකඟවන බව හා මෙම කරුණු 2023 ගිණුම් වර්ෂයේ සිට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගන්නා බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම් යථෝක්ත ප්‍රමිතයේ 14(ඇ) ජේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහයන් යටතේ වාර්තා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ණයවර ලිපි ආන්තික ගිණුම මගින් ආනයන භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවා | නිරීක්ෂණයට එකඟවන බව හා මෙම කරුණු 2023 ගිණුම් වර්ෂයේ සිට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගන්නා බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණු රු.11,985,681 ක් ආයෝජන ක්‍රියාකාරම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වාර්තාකර තිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, ආයුගණක ක්‍රමය (Actuarial method) භාවිතා කරමින් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක් විසින් සිදුකර තිබුණු ගණනය කිරීම් අනුව 2018 දෙසැම්බර් 31 දිනට නිරත සේවකයින් 383 දෙනෙකු පදනම් කරගෙන රු.40,174,665 ක් පාරිතෝෂික සඳහා වෙන්කර තිබුණු අතර එය ඉන් පසු වර්ෂවලදී අනුගමනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේද මෙම ප්‍රමිතයට අනුව කටයුතු කරන බවට වූ සාවද්‍ය සටහනක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එලෙස කටයුතු කර නොතිබුණු අතර, ඒ වෙනුවට සංස්ථාවේ සේවකයින් 240 කට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස වැටුප්වල එකතුවෙන් අඩක් හෙවත් රු.4,522,772 ක් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. විමසුම්වලට පිළිතුරු වශයෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන්කර ඇති බවට ප්‍රකාශ වුවද, එම පනත ප්‍රකාරවද වෙන් කළ යුතු ප්‍රමාණය රු.85,751,940 ක් විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානයට වෙන්කර තිබුණු ප්‍රමාණය රු.35.461,706 ක් වූයෙන් ඌන වෙන්කිරීම රු.50,290,234 ක් විය. | ආයුගණක ක්‍රමය යටතේ පාරිතෝෂිත ගණනය කිරීම් සඳහා පෙර පරිදිම බාහිර විගණන ආයතනකින් සහය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව හා ඒ සඳහා ලැබෙන අනුමැතිය අනුව ඉදිරි ගිණුම් වර්ෂයේදී මේ සම්බන්ධ ගැලපීම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, ආයු ගණක ක්‍රමය (Actuarial method) අඛණ්ඩව භාවිතා කරමින් වාර්ෂිකව පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදුකළ යුතුය. |

**1.5.3. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නෛතික ප්‍රතිපාදනවලට අනුව සංස්ථාවට නොමිලේ ලැබෙන ඖෂධ අමු ද්‍රව්‍යවලට මිල කමිටුවක් මගින් මිලක් නියම කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරිමට 2022 අප්‍රේල් 28 දිනැති අංක 14193 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන තිබුණු අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු කංසා අගිල් හා කොතලහිඹුටු ප්‍රමාණය රු.52,744,536 කට | විමසුම හා එකඟවන බව හා 2023 ගිණුම් වර්ෂයේ නිවැරදි කරන බව. | නොමිලයේ ලැබෙන ඖෂධ සම්බන්ධයෙන් සුදුසු හා නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට හා එය අඛණ්ඩව අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අගය කර එය විලම්බිත අදායමක් වශයෙන්ද, 2021 වර්ෂයේ නිෂ්පාදනය සඳහා භාවිතා කළ ප්‍රමාණය රු.8,092,119කට අගය කර එය විවිධ ආදායමක් වශයෙන්ද ගිණුම් ගත කර තිබුණි. එසේ වුවද, නොමිලේ ලැබෙන අමුද්‍රව්‍ය අගය කර දැක්වීම මගින් මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කරන තොරතුරුවලට අහිතකර බලපෑමක් ඇති වන බව ප්‍රකාශ කරමින් උක්ත ගිණුම් තැබීම ආපසු ගැලපීමට 2023 ජුනි 16 දිනැති අංක 14420 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ විලම්හිත අදායම් ගිණුමේ ශේෂය වූ රු.52,744,536 ක් නැවත ගිණුම් අතර ගැලපීමට කටයුතු කර තිබුණි. ඒ අනුව නොමිලයේ ලැබෙන ඖෂධ සම්බන්ධයෙන් සුදුසු හා නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට හා එය අඛණ්ඩව අනුගමනය කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | සංස්ථාව සතු ඔසු උයන්වලින් සපයා ගනු ලබන වියලි ඔසු අමුද්‍රව්‍යවල පිරිවැය හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ඔසු උයන්වලින් ලැබී තිබුණු වියලි ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 4,665 ක් රු. 1 බැගින්ද කිලෝග්‍රෑම් 21,423ක් පවත්නා වෙළඳපල මිල යටතේද රු.6,196,457 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. | ඔසු උයන් වලින් නිෂ්පාදනාගාර වෙත ලබා ගන්නා අමු ද්‍රව්‍ය සංස්ථාව විසින් නියම කර ඇති සහතික මිල ගණන් අනුව හා එසේ සහතික මිලක් නියම කර නොමැති අමු ද්‍රව්‍ය කාලීන මිල කිරීමක් සහිතව ගිණුම්ගත කිරීමට ඉදිරියේදී පියවර ගන්නා බව. | ඔසු උයන්වලින් සපයා ගනු ලබන අමු හා වියලි ඔසු අමුද්‍රව්‍යවල පිරිවැය හඳුනාගැනීම සඳහා අඛණ්ඩව අනුගමණය කළ හැකි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඖෂධයේ චූර්ණයට මිශ්‍ර කර පුද්ගලික වෛද්‍යවරුන් හා ඖෂධ නිෂ්පාදනාගාර වෙත අලෙවි කරන කංසා කිලෝග්රෑම් 01ක විකුණුම් මිල ඉකුත් වර්ෂයේ රු.20,000 ක්ද සමාලෝචිත වර්ෂයේ රු.15,000ක්ද විය යුතු බවට මිල කමිටුවක් විසින් තීරණය කර තිබුණි. ඒ අනුව විකුණන ලද කංසා ඉකුත් වර්ෂයේ කිලෝග්රෑම් 199.2 ක් හා සමාලෝචිත වර්ෂයේ කිලෝග්රෑම් 224.69 ක් පිළිවලින් රු.3,984,000ක් හා රු.3.370,350ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. නොමිලේ ලැබී තිබුණු හා සාමාන්‍ය වෙළඳපල තුළ අලෙවි නොවන තහනම් ද්‍රව්‍යක් වන කංසා කිලෝග්රෑම් එකක විකුණුම් මිල ඉකුත් වර්ෂයේ රු.20,000කට සහ සමාලෝචිත වර්ෂයේ මිල රු.15,000කට තීරණය කිරීමට යොදාගත් පදනම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | පොලීසිය සහ හමුදාව විසින් අත්අඩංගුවට ගන්නා වියලි හා අමු කංසා තොග අධිකරණ තීන්දු මත සංස්ථාවට ලැබෙන බව. වියළි කංසා තොග ලබා ගැනීම සඳහා වෛද්‍යවරයෙකු, ස්ථානභාර නිළධාරියෙකු, ආරක්ෂක නිළධාරියෙකු, තොගය භාරගෙන සංස්ථාව වෙත ප්‍රවාහනය කරන බව. කපන ලද අමු ශාක අත්අඩංගුවට ගැනීමකදී එම තොග රැස් කිරීම, ප්‍රවාහනය, වේලීම, ගබඩා කිරීම ආදී කාර්යන් වලට දැරීමට සිදු වන වියදම වෙනස් වන බව හා මේ පිළිබඳව අවධානය යොමු කර මිල තීරණය කරන බව. | විශේෂ ගනුදෙනුවලට අදාළ ප්‍රමාණවත් අතිරේඛ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.4. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවල හා ඖෂධ අලෙවිසැල්වල පැවැති හානිවූ හා කල් ඉකුත්වූ තොග වෙනුවෙන් රු. 8,670,825 ක් වෙන් කර තිබුණු නමුත් හානිවූ හා කල් ඉකුත් තොගයේ තථ්‍ය වටිනාකම රු. 12,885,943 ක් වූයෙන් ඌණ වෙන් කිරීම රු.4,215,118 ක් විය. තවද, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හානි වූ හා කල් ඉකුත් වූ නිමි ඖෂධ ඒකක 133,873 ක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය රු.3,287,068 ක් වුවද එදිනට හානි වූ තොග සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.4,343,168 ක් වූයෙන් රු. 1,056,100 ක අධි වෙන් කිරීම ඉකුත් වර්ෂයේ ලාභයට හඳුනාගත යුතු වුවද, ඒ සඳහාද අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | විමසුම හා එකඟවන බව හා 2023 ගිණුම් වර්ෂයේ නිවැරදි කරන බව. | හානිවූ සහ කල්ඉකුත් වූ තොගවල පිරිවැයට සාපේක්ෂව ඒ සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය කාලීනව ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අලෙවි අංශයේ විකුණුම් වාර්තා සමඟ මූල්‍ය අංශයේ විකුණුම් වාර්තා සැසඳීමේදී, අත්පිට විකුණුම් රු.732,947 ක් සහ ණයට විකුණුම් රු.14,004,863 ක් අඩුවෙන්ද,ජංගම විකුණුම් රු.1,070,304 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.13,666,506ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | විමසුම හා එකඟ වන බව හා ගිණුම් අංශය විසින් මූලාශ්‍ර ලේඛන පදනම් කර ගනිමින් විකුණුම් වාර්තා පවත්වා ගෙන යන අතර අළෙවි අංශය විසින් ඔවුන්ගේ පරිහරණය සඳහා මූලාශ්‍ර ලේඛන රහිතව විකුණුම් වාර්තා පවත්වාගෙන බව. | විකුණුම් ආදායම උපචිත පදනම මත හඳුනාගත යුතුය. යාවත්කාලීන විකුණුම් තොරතුරු සම්පාදනය සඳහා අලෙවි අංශය හා ගිණුම් අංශය අතර අඛණ්ඩ අන්තර් සම්බන්ධතාවයක් සහ නිරන්තර සැසඳුම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක ඇප රු.267,815 ක් වුවද, සේවක ඇප කේවල ශේෂ ලැයිස්තුව අනුව සංස්ථාවේ සේවකයන් 68 දෙනෙකුගේ නිදහස් නොකල ඇප වටිනාකම රු.851,215 ක් වූයෙන් රු.583,400 ක්වූ සේවක ඇප අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණයට එකඟ වන බව හා මෙම කරුණ ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම්ගත තොරතුරු හා කේවල ශේෂ ලැයිස්තු කාලීනව සැසඳුම් කිරීමේ පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය රු.825,362,289ක් ලෙස දක්වා තිබුණද එක් එක් වත්කම් කාණ්ඩයට අදාළ ප්‍රත්‍යාගණන සංචිත ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනා ගත හැකි පරිදි ගිණුම් සටහනක් මඟින් හෙළිදරව් කර නොතිබුණි. | විමසුම හා එකඟවන බව හා පසුගිය වාර්තා පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකළ යුතුය. |
| (ඉ) | 2023 අගෝස්තු 21 දිනැති මහජන බැංකුවේ ශේෂ සනාථ ලිපිය ප්‍රකාරව 2015 හා 2019 වර්ෂවල විවෘත කරන ලද ණයවර ලිපි ආන්තික ගිණුම් 03ක ශේෂ එකතුව රු.1,951,492ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.31,245,792ක් ලෙස රු.29,294,300ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආනයනික ද්‍රව්‍ය සම්බන්ධ සියලු පියවීම් ගිණුම් අංශයට ඉදිරිපත් නොකිරීම නිසා පරිගණක පද්ධතියට ඇතුලත් නොවීම හේතුවෙන් එම වෙනස සිදු වී ඇති බව හා අදාළ වාර්තා ගිණුම් අංශයට ලද වහාම ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | මෙම වරද වහාම නිවැරදි කළ යුතු අතර ගිණුම් අංශයේ අධීක්ෂන ක්‍රියාවලිය සමාලෝචනය කර විධිමත් කළ යුතුය. |
| (ඊ) | 2011/2012 සිට 2013/2014 දක්වා තක්සේරු වර්ෂවලට අදාලව වෙන්කර තිබුණු රු.12,673,956 ක්වූ ආදායම් බදු 2015,2016 සහ 2017 යන වර්ෂවල දේශීය අදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවා තිබුණු අතර එම ගෙවීම් අදායම් බදු වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට "ලාභාංශ බදු" නමින් වූ ව්‍යාජ වත්කම් ගිණුමකට හර කර තිබුණි. මෙම වරද නිවැරදි කිරීම සඳහා අදාල ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අදායම් බදු වෙන් කිරීමේ ගිණුමට එරෙහිව කපා හැරීමට කටයුතු කිරීම වෙනුවට 2017 සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව එක් එක් වර්ෂවලට අදාල අදායම් බදු ගැලපීමේ සටහන් වල දැක්වෙන අදායම් බදු වෙන්කිරීමේ ගිණුමේ ශේෂයෙන් උක්ත ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අඩුකර දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණයට එකඟ වන බව හා බදු උපදේශකවරයකුගේ සේවාව ලබා ගෙන මේ සඳහා අවශ්‍ය ගැලපීම් ඉදිරියේදී ඉටු කිරීමට කටයුතු කරන බව. | ආදායම් බදු බැඳියාවක් නොමැති බවට ලිඛිත සනාථන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ගනුදෙනුවක නියමිත වටිනාකමට වඩා වැඩියෙන් ලැබීම් හෝ ගෙවීම් සිදු වූ අවස්ථාවලදී ඒවා නිවැරදි නොකිරීම හා නිවැරදිව ලැබීම් ගෙවීම් සටහන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ගිණුම් 150 ක එකතුව රු.499,286 ක් වූ බැර ශේෂද, ණයහිමි ගිණුමක රු. 273ක හර ශේෂයක්ද ඉතිරිව තිබුණු අතර එම ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කිරීම වෙනුවට ණය ගැතියන් ගෙන් වැඩිපුර මුදල් ලැබීම් ජංගම වගකීම් යටතේද ණයහිමියන්ට වැඩිපුර ගෙවීම් ජංගම වත්කම් යටතේද ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ණයහිමි ගිණුමක හර ශේෂය අත්තිකාරම් මුදල ඉක්මවා පියවීම නිසා සිදු වී ඇති අතර එය 2023 ගිණුම් වර්ෂයේදී නිවැරදි කරන බව හා ණයගැති බැර ශේෂය පිළිබඳව වැඩිදුරටත් සොයා ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව. | ණයහිමියන් හා ණයගැතියන් සම්බන්ධයෙන් පාලන ගිණුම් පවත්වා ගතයුතු අතර ලැබීම් ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. කාලීන සැසඳුම් හා නිරවුල් කිරීමේ පාලන ක්‍රම ස්ථාපිත කළ යුතුය. |

**1.5.5. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව (රු.) | අනුරූපී වාර්තා අනුව (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) ලැබිය යුතු සේවක ණය ශේෂය | 33,413,306 | 32,582,125 | 831,181 | විගණන නිරීක්ෂණයට එකඟ වන බව හා මෙම කරුණ ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම්ගත තොරතුරු හා කේවල ශේෂ ලැයිස්තු කාලීනව සැසඳුම් කිරීමේ පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂයේ සේවකයන්ගෙන් අයකර ගත් ණය | 19,629,951 | 19,379,951 | 250,000 | - එම - | - එම - |
| iii) ණයගැති ශේෂය | 148,120,041 | 145,290,977 | 2,829,064 | මෙම තත්වය නිවැරදි කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ කාල විශ්ලේෂණ අනුව ශේෂ සමඟ සසඳා වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |

**1.5.6. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) ඉඩම් | 636,000,000 | පැවරුම් නියෝග හා හිමිකම් සහතික | විගණන නිරීක්ෂණයට එකඟ වන බව. මෙම තොරතුරු වසර 15ක පමණ සිට ඉදිරිපත් කල යුතුව ඇති බව හා මේ පිළිබදව වැඩිදුරටත් පරීක්ෂා කර අදාල ලියකියවිලි හා ලිපි ගොණු විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති වත්කම්, වගකීම්, ප්‍රාග්ධනය හා සංචිත සම්බන්ධයෙන් මූලාශ්‍ර ලේඛන සහ ලෙජර ගිණුම් ඇතුළු විස්තරාත්මක තොරතුරු විධිමත්ව පවත්වා ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | සාමාන්‍ය වියදම් අත්තිකාරම් | 5,006,437 | අදාළ උපලේඛන | - එම - | - එම - |
| (iii) | ණයවර ලිපි වලට අදාල සියයට 10 ක රැඳවුම් මුදල් | 1,894,902 | අදාළ උපලේඛන | - එම - | - එම - |
| (iv) | ටෙන්ඩර් ආරක්ෂිත තැන්පතු | 15,076,310 | තැන්පතු ලේඛන, උපලේඛන හා කාල විශ්ලේෂණය | - එම - | - එම - |

**1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1. ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු.148,120,041ක් වූ ණය ගැති ශේෂ 103 කින් රු.122,112,233 ක් වූ ශේෂ 83කට අදාළ ණය ගැතියන් වෙත පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණි. ඉන් රු.76,049,448 ක්වූ ශේෂ 64ක් තහවුරු කර නොතිබුණි. පිළිතුරු එවා තිබුණු රු. 46,970,144 ක් වූ ණය ගැති ශේෂ 19 කින් රු. 4,774,576 ක් වූ ණය ගැතියන් 12 දෙනෙකු විසින් ගෙවීමට මුදලක් නොමැති බව සඳහන් කර තිබුණි. තවත් ණය ගැතියන් 05 දෙනෙකුට අදාලව පොත් අගය රු. 41,316,793 ක් වුවද, එම ණය ගැතියන් විසින් තහවුරු කළ ශේෂය රු. 25,519,958 ක් විය. ඒ අනුව රු. 119,101,188 ක්වූ ණය ගැති ශේෂ 91ක් ශේෂ සනාථ කිරීම් මගින් තහවුරු වී නොතිබුණි. | ශේෂ සනාථන ලිපි සඳහා පිළිතුරු නොලැබීම පාලනය කළ නොහැකි තත්ත්වයක් බව හා ශේෂ සනාථන අගය හා පොත් අගය අතර වෙනසක් ඇත්නම් ඒවා හඳුනාගෙන ඉදිරි කටයුතු කරන බව. | ණයගැති ශේෂවල නිරවද්‍යතාව හා ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදුකළ යුතු අතර එහි ප්‍රතිඵල විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**1.6.2. ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු. 149,673,300 ක්වූ ණයහිමි ශේෂ 116 කින් රු. 117,875,459 ක්වූ ශේෂ 61කට අදාළව පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණි. ඉන් රු.31,932,249 ක ණයහිමි ශේෂ 10කින් රු. 469,998 ක්වූ ණයහිමියන් 03 දෙනෙකු අයවීමට මුදලක් නොමැති බව ප්‍රකාශ කර තිබුණි. තවත් ණයහිමියන් 02 දෙනෙකුට අදාළ පොත් අගය රු. 262,098 ක් වුවද තහවුරු කළ ශේෂය රු. 103,188 ක් විය. එක් ණයහිමියකුට අදාල පොත් අගය රු. 426,750 ක් වුවද එම අගය රු. 436,500 ක් බවට තහවුරු කර තිබුණු අතර ණය හිමියන් 04 දෙනෙකු ශේෂ සමග එකඟ වී තිබුණි. ඒ අනුව රු.118,058,608 ක්වූ ණයහිමියන් 106 කට අදාළ ණය ශේෂයන්, ශේෂ සනාථ කිරීම් මගින් තහවුරු වී නොතිබුණි. | ගිණුම් අංශය විසින් ණය හිමියන් සම්බන්ධව විස්තරාත්මක තොරතුරු පවත්වාගෙන නොයන අතර එය පරිගණක පැකේජය හරහා සිදු කරන බව හා ශේෂ සනාථන ලිපි සඳහා පිළිතුරු නොඑවීම ගිණුම් අංශයේ පාලනයෙන් බැහැර ක්‍රියාවලියක් වන බව. | ණයහිමි ශේෂවල නිරවද්‍යතාව හා ණය ගෙවීමේ හැකියාව පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදුකළ යුතු අතර, එහි ප්‍රතිඵල විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.3. අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාගත් මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්ය නිමකළ විගසම හෝ කාර්ය නිමකර දින 10ක් තුළ මුදල් රෙගුලාසි 371 (2) හා (5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03 / 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අග්‍රිමය පියවිය යුතු නමුත් නිලධාරින් 09 දෙනෙකු ලබා ගෙන තිබුණු එකතුව රු.579,900 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම 21ක් ආපසු පියවීම සඳහා කාර්ය නිම කර දින 10 ඉක්මවා දින 05 සිට දින 134ක් අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. තවද, අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙර අග්‍රිමය ආපසු භාරදීම සිදු කළ යුතු වුවද, නිලධාරින් 10 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී ලබා ගෙන තිබුණු එකතුව රු. 169,408 ක තත්කාර්ය අතුරු අග්‍රිම සහ සුළු මුදල් භාරකරුවන් 12 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.76,530 ක සුළු මුදල් අත්තිකාරම් 2022 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් පියවන ලෙස එම අත්තිකාරම් ලබා ගත් නිළධාරීන්ට ලිඛිතව දන්වා ඇති අතර විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව සියලුම මාණ්ඩලික නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| (i) 18(4) වගන්තිය | පනතේ 18(2) වගන්තිය අනුව තීරණය කරන ලද විගණන ගාස්තු අදාළ ආයතනය විසින් ඉන්වොයිසියේ සඳහන් දිනයේ සිට දින 30 ක් ඇතුළත නිරවුල් කළයුතු වුවත් එකී විධිවිධාන ප්‍රකාරව 2019 සිට 2021 වර්ෂය දක්වා එකතුව රු.4,836,000 ක්වූ විගණන ගාස්තු 2023 සැප්තැම්බර් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2018 තෙක් විගණන ගාස්තු වාරික වශයෙන් ගෙවා ඇති බව. 2019 සිට 2021 දක්වා විගණන ගාස්තුද වාරික වශයෙන් ගෙවීම් කිරීමට කටයුතු කරන බව හා සංස්ථාවේ මූල්‍ය තත්වය අවධානයට ගෙන ඉදිරියේදී කඩිනමින් මෙම මුදල් ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 38(I)(ඉ) වගන්තිය | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාළ සීමාවන් තුළ සියලු විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතුය. එසේ වුවද 2019, 2020, 2021 හා 2022 යන ගිණුම් වර්ෂවලට අදාළ විගණන විමසුම් 24 ක් සඳහා පිළිතුරු | විගණන නිරීක්ෂණය නිවැරදි බව හා ඉතිරි විගණන විමසුම් සඳහා 2023 නොවැම්බර් 30 දිනට පෙර පිළිතුරු සැපයීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සැපයිමට 2023 ඔක්තෝබර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | 39(1) හා 39(2) වගන්ති | 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන විස්තරාත්මක විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් එම වාර්තාවේ දින සිට මාස 03ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු තිබේ නම් ඒ බව විගණකාධිපතිවරයා වෙතද, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයා වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු වුවද, එකී විධිවිධාන ප්‍රකාරව 2020 සහ 2021 වර්ෂවල විස්තරාත්මක විගණකාධිපති වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග 2023 ඔක්තෝබර් 31 දින වනවිටද ගෙන නොතිබුණි. | 2020 සහ 2021 වර්ෂයේ විස්තරාත්මක විගණකාධිපති වාර්තා අදාල ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිළධාරීන් වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අවධානය යොමු කර ඇති බව හා ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධව විගණකාධිපති, භාණ්ඩාගාර ලේකම් සහ අමාත්‍යවරයා වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 103, 104 සහ 105 | මුළු පිරිවැය රු.12,885,943 ක් වූ කල් ඉකුත් වූ හා භාවිතයට ගත නොහැකි තොග සහ මුළු පිරිවැය රු.9,459,348 ක් වූ තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, අලෙවි මධ්‍යස්ථාන හා ගබඩා 8 ක 2019 වර්ෂයට අදාළ එකතුව රු. 2,178,305 ක් වූ ඌනතා සහ රු. 1,484,545 ක් වූ අතිරික්තතා සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 01 දිනැති අංක 14,026 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගෙන තිබුණු තීරණ අනුව කටයුතු කර නොතිබුණි. | ඌනතා හා අතිරික්තතා කමිටුවක් පත්කර ඇති බව හා එම කමිටුව විසින් ඌනතා අතිරික්තතා සහ හානිවීම් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන අදාළ නිර්දේශ ක්‍රියාත්මක කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 395(ඇ) | එක් එක් මාසයේ ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කලයුතු වූවත්, බැංකු ජංගම ගිණුම් 04ක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මූලාශ්‍ර ලේඛන ප්‍රමාද වී ලැබීම මත ගණුදෙනු ගිණුම් ගත කිරීමට ප්‍රමාදවන අතර බැංකු සැසඳුම් ප්‍රකාශනද ප්‍රමාද වන බව හා මේවන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින නව පරිගණක පැකේජය ලද පසු මෙම ගැටලු මඟහරවා ගත හැකි බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 756 (6) | සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා අනුව අලෙවි සැල් 13 ක රු.1,223,002 ක්වූ නිමි තොග ඒකක 9,966ක ඌනතාවයක් හා රු. 251,821 ක්වූ නිමි තොග ඒකක 813 ක අතිරික්තයක්ද අමුද්‍රව්‍ය ගබඩා 06 ක හා අංක 10 ,24, 8, 13 ගබඩාවල රු. 8,236,346 ක් වූ තොග ඒකක 60,433 ක ඌනතාවයක් හා රු.4,784.698 ක් වූ තොග ඒකක 89,253 ක අතිරික්තයක්ද පැවැති නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඌණතා හා අතිරික්තතා කමිටුව ස්ථාපිත කර කමිටු වාර 2ක් මේ වනවිට අවසන් කර ඇති අතර අවසන් නිර්දේශ වාර්තා කඩිනමින් ලබා ගෙන මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 880 හා 881 | ඇප තැබිය යුතු නිලධාරින් 02 දෙනෙකු විසින් එකතුව රු.40,000 ක් වූ ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද රජයේ ගිණුමට අදාල වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන නිලධාරින්ද ඇප තැබිය යුතු වූවත්, එකී විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සංස්ථාවේ ඇප තැන්පත් කල යුතු මුදල් අයකැමිවරුන් සහ ස්ථානභාර නිළධාරීන් සියළු දෙනා විසින් මේ වන විට ඇප තැන්පත් කර ඇති බව හා රජයේ ගිණුමට අදාල වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන නිලධාරින්ගේ ඇප සම්බන්ධවද ඉදිරි කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන දිරි දීමනා රු.20,917,337 ක්, පැමිණීමේ දීමනා රු. 9,897,950 ක්, ඵලදායිතා දීමනා රු. 34,114,768 ක් ද, වශයෙන් එකතුව රු. 64,930,055 ක් ද, ඇතුළුව පසුගිය වර්ෂ 08කදී රු. 611,071,569 ක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක වන බව. ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත | විධිමත් අනුමැතිය ලබා ගත් දිරිදීමනා යෝජනා ක්‍රමයක් මත පමණක් දිරිදීමනා ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | තොරව දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි. | ඉදිරිපත් කර ඇතත් මේ දක්වා අනුමැතිය ලැබී නොමැති බව හා නිෂ්පාදන ඉලක්ක ලඟාකර ගැනීමේදී දීර්ඝකාලයක් ක්‍රියාත්මක වූ සේවක අභිප්‍රේරණ ක්‍රමයක් අත්හිටුවීමට නොහැකි බව. | |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3(X) | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරින් වෙත ලබා දෙනු ලබන ණය පහසුකම් 2022 වසර අවසන් වන තෙක් අත්හිටුවීමට කටයුතු කළයුතු නමුත් සමාලෝචිත වර්ෂයේ මාණ්ඩලික නිලධාරින් 04 දෙනෙකු වෙත එකතුව රු.1,000,000 ක ණය මුදලක් එකී විධිවිධාන වලට පටහැනිව ලබා දී තිබුණි. | නිලධාරියකු සේවයෙන් ඉවත් වීම නිසා සම්පූර්ණ මුදල අයකරගත් අතර අනෙක් නිළධාරීන්ගෙන් වාරික අයකර ගනිමින් පවතින බව හා ඉදිරියේදී චක්‍රලේඛවලට අවධානය යොමු කරමින් කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.12 ඡේදය | වියදම් පිළිබඳ ඵලදායි පාලනයක් හඳුන්වාදීම සඳහා ඉහල මට්ටමේ කළමනාකරණ කමිටුවක් පිහිටුවා සෑම මසක් අවසානයේදීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නාස්තිය සහ අකාර්යක්ෂමතාව අවම කිරීම සහ පොදු කාර්ය පිරිවැය අඩු කිරීම මඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වූ ප්‍රවේශයන්, අදාළ වන පරිදි ව්‍යාපාර ප්‍රතිලාභ සහ විදේශ විනිමය ඉපයීම් වැඩි දියුණු කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන්, මානව සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා වන යෝජනා සහ මෙහෙයුම් සහ පොදු කාර්ය පිරිවැය අඩු කිරීම සඳහා සරල තොරතුරු තාක්ෂණ විසඳුම් යනාදී වශයෙන් වූ සිය නිර්දේශ වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. නමුත් එකී විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | වියදම් ඵලදායීව පාලනය කිරීම සඳහා අංශ ප්‍රධානීන්ගේ රැස්වීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කර උපදෙස් ලබා දුන් බව. වියදම් සම්බන්ධ තොරතුරු සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකටම ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව. නව නිෂ්පාදන හා නව ඇසුරුම්කරණ හඳුන්වා දීමට, අලෙවි කටයුතු දියුණු කිරීමට සහ අලෙවිය සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රම භාවිතා කිරීමට කටයුතු කර තිබෙන බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 1.01 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 17.73 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 18.74 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මිල ඉහළ දැමීම හේතුවෙන් ඉකුත් වර්ෂයට වඩා විකුණුම් ආදායම රු..මිලියන 135.67 කින් වැඩිවීම හා පොලී අනුපාතය ඉහළයාම හේතුවෙන් ස්ථාවර තැන්පතු මත මූල්‍ය ආදායම් රු.මිලියන 13.92 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 16.95 කින් වැඩිවී තිබුණු නමුත් විකුණුම් පිරිවැයද සියයට 14.89 කින් වැඩිවී තිබුණි. වෙනත් ආදායම් රු.මිලියන 8.75 කින් වැඩිවී තිබුණද ආයතන හා පරිපාලන වියදම් රු.මිලියන 32.01 කින් හා විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.මිලියන 19.90 කින් වැඩිවීම නිසා මෙහෙයුම් කටයුතු වලින් රු.මිලියන 15.34 ක අලාභයක් ලබා තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 1.29 කින් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 2.22 කින් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිෂ්පාදිත ඖෂධ වර්ගය මත බර තැබීමක් කරමින් අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකි වන නමුත් එවැනි ක්‍රමයක් වෙනුවට රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02 ත් රු.මිලියන 07 ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ රු. 52,781,881ක් ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු. 64,930,055 ක් දක්වා සියයට 23 කින් වැඩිවී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යන අවස්ථාවලදී සංස්ථාවේ ලාභදායිත්වය අඩු වුවද ගෙවන නිෂ්පාදන දිරි දීමනාව වැඩි කිරීමට සිදුව තිබුණි. | නිෂ්පාදන ඒකක ප්‍රමාණය මත ගණනය කරන දිරි දීමනා ක්‍රමයක් මේ වන විට ක්‍රියාත්මක වන බව. නිෂ්පාදන පිරිවැය ඉහල යන අවස්ථා වලදී ඒ හා සමානව සිදු වන බලපෑම අවම කිරිම සඳහා වර්තමානයේදී ගෙවීම් කරනු ලබන්නේ 2021 වර්ෂයේ පැවති නිෂ්පාදන පිරිවැය පදනම් කරගෙන බව. | විවිධ කාර්යසාධනයන් සහිත අංශ ඒ අනුව ඇගයීම වෙනුවට නිෂ්පාදන කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා යෙදාගන්නා නිෂ්පාදන පිරිවැය මතම සියලුම අංශ ඇගැයීම නුසුදුසු වන අතර අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන අංශයට පමණක් හා වෙනත් කාර්යසාධන මත ගණනය කරන දිරි දීමනාවක් සෙසු අංශවලට හඳුන්වා දීමට පියවර ගෙන ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගබඩා තුළ ක්‍රමවත් ලෙස තොග ගබඩාකර නොතිබුණු අතර උපරිම, අවම හා යලි ඇණවුම් හා ආර්ථික තොග මට්ටම් පවත්වා නොතිබුණු බවත්, බින් කාඩ් හා තොග ලෙජර විධිමත්ව භාවිතා කර නොතිබුණු බවත්, සෙමින් චලනය වන තොග පැවති නමුත් එම අයිතම හඳුනාගෙන අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කර නොතිබුණු බවත්, ඖෂධවල මිල වැඩිවීම, ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කර තිබුණු ඖෂධ වර්ග කල් ඉකුත් වූ ඖෂධ සමඟ එකට ගබඩාකර තිබුණු බවත්, එම තොග නැවත ලේබල් කර අලෙවි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන කල් ඉකුත් වීමට ඉඩ හැර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල හා ගබඩාවල පවතින කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග දීර්ඝ කාලයක සිට තොග පොත්වලින් ඉවත් නොකර සාමාන්‍ය තොග ලෙස ගණනය කර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල පැවැති කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග මධ්‍යම ගබඩාවලට ප්‍රවාහනය නොකිරීම නිසා අක්‍රමිකතාවයන් සිදුවීමට ඉඩකඩ පැවැති බවත්, අලෙවි මධ්‍යස්ථානවල විශාල ඉඩ ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවති බවත්, නිරීක්ෂණය විය. | බින් කාඩ්පත් පවත්වාගෙන යාම වර්තමානයේ ඉතා අපහසු බව. අලෙවි මධ්‍යස්ථාන වල තොග ලෙජර් යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇති බව. දැනට අවුරුදු 03 ක හානිවූ තොග පවතින බැවින් ඉතා ඉක්මනින් මෙය විනාශ කිරීමට පියවර ගෙන ඉදිරියේ දී යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරන බව. ගබඩාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් 2022 හා 2023 හානිවූ තොග එකම ස්ථානයක රැස්කර තැබීමට සිදුවී ඇති බව. ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කරන ඖෂධ නැවත නිෂ්පාදනාගාරයට යවා නැවත ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත් කර ගන්නා බව හා 2023 ඔක්තෝබර් මස සිට උපරිම, අවම හා යලි ඇණවුම් හා ආර්ථික තොග මට්ටම් සකස් කර නිෂ්පාදන සැලසුම් සකස් කිරීමට පියවර ගෙන ඇති බව. | ගබඩා හා තොග පරිපාලනය විධිමත් කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ සමස්ථ විකුණුම් ආදායම් ඇස්තමේන්තුව රු. 970,000,000 ක්වූ අතර තත්‍ය ආදායම රු. 935,892,860 ක් විය. ඉන් රු. 681,103,129 ක් හෙවත් සියයට 73 ක්ම රාජ්‍ය අංශයෙන් ලැබී තිබුණු අතර පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණු ආදායම රු.254,789,731 ක් හෙවත් සියයට 27 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු. 305,000,000 ක්වූ පෞද්ගලික අංශයේ ඇස්තමේන්තුවෙන් රු. 49,809,990 ක් හෙවත් සියයට 16 ක ආදායම් ඉලක්කයක් ලඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. නිරායාසයෙන් ලැබෙන රාජ්‍ය අංශයේ ඉල්ලුම කෙරෙහි ඇති වැඩි නැඹුරු වීමත්, වෙළඳ පොළ | විකුණුම් මිල පිළියෙළ කිරීම සඳහා නිෂ්පාදිත පිරිවැය පදනම් කර ගැනීමට අදාල වාර්තා පිරිවැය අංශය විසින් ඒ ඒ අවස්ථා වලදී ලබා දී ඇති බව. පෞද්ගලික අංශයේ අලෙවිය වැඩිකිරීම සඳහා ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් සිදු කරමින් පවතින බව හා 2023 වර්ෂයේ සිට අලෙවි නියෝජිතධුර යලි ස්ථාපනය කිරීම හා අපනයන කටයුතුවලට සුදුස්සන් තෝරා ගැනීමේ කටයුතු කරමින් පවතින බව. | පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීම සහ ප්‍රමාණවත් නොවීමත්, පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම අඩුවීමට හේතුවී තිබුණි. | | |
| (ආ) | සංස්ථාව විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරඟකාරී ආයතන අතර සංස්ථාවේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් නොතිබුණි. | සංස්ථාවේ අලෙවි අංශය විසින් ඒ ඒ අලෙවි මධ්‍යස්ථාන හා පොදුවේ වෙළඳපල සමීක්ෂණ සිදු කර ඇති අතර තරගකාරී ආයතන වල නිෂ්පාදන, මිල ගණන් හා අලෙවි උපක්‍රම පිළිබඳව නිරීක්ෂණය කර අලෙවි අංශයේ රැස්වීම් වලදී සාකච්ඡා කර ඇති බව හා සංස්ථාවේ වෙළඳපල කොටස, පාරිභෝගික අදහස් හා පවතින අවස්ථාවන් ආදිය පිළිබඳව සමීක්ෂණ සිදු කිරීම සඳහා පිළිගත් වෘත්තීය ආයතනයකට ලබා දීමට සැලසුම් කර ඇති බව. | සංස්ථාවේ වෙළඳපල කොටස තීරණය කිරීම සඳහා, එය වර්ධනය කර ගැනීම සඳහා මෙන්ම නව පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් වන පරිදි වෙළඳපල ප්‍රවනතා හඳුනාගැනීම සඳහා වෙළඳපල සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, අරිෂ්ඨ , ආසව, තෙල්, ක්වාත, සිරප් ඇතුළු ඖෂධීය දියර වර්ගයන්ගෙන් සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය ලීටර. 627,712 ක් හා චූර්ණ, ගුගුල්, කල්ක, ලේප, ලේහ, මෝදක, රස, වටී ඇතුළු ඖෂධීය ද්‍රව්‍යයන්ගෙන් සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්. 151,179 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, තත්‍ය නිෂ්පාදනය පිළිවෙලින් දියර වර්ගයන්ගෙන් ලීටර. 389,750 ක් හා ද්‍රව්‍ය කිලෝග්‍රෑම්. 70,799 ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් දියර වර්ගයන්ගෙන් ලීටර. 237,962 ක් එනම් සියයට 38 කින් හා ද්‍රව්‍ය කිලෝග්‍රෑම්. 80,380 කින් එනම් සියයට 53 කින් ළඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන 12 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 2135 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 1441 ක් වූයෙන් වැඩපත් 694 ක ප්‍රමාණයක් එනම් සියයට 33 ක්, ප්‍රධාන නිෂ්පාදනාගාරයේ නව නිෂ්පාදන 04 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 215 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් | 2022 වසරේ වාර්ෂික සැළසුම් ගත නිෂ්පාදනය කර්මාන්තශාලා පිරිවැය මිළ අනුව රු.683,458,641ක් වුවද , සත්‍ය වාර්ෂික නිෂ්පාදනය පිරිවැයට රු.495,531,635 ක් බව, ඒ අනුව වාර්ෂික සැළසුම්ගත නිෂ්පාදනයේ රු.187,927,006ක අඩු වීමක් පෙන්නුම් කර ඇති නමුත් වාර්ෂික සැළසුම් ගත නිෂ්පාදනයෙන් සියයට 72.5ක පමණ ඉලක්කයක් කරා ලඟා වීමට හැකි වූ බව. 2022 වර්ෂයේ පැවති අර්බුධකාරී තත්ත්වය හමුවේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, අමු ද්‍රව්‍ය හිඟය, ප්‍රවාහන ගැටළු, කාරක ප්‍රාග්ධන ගැටළු, සේවක පැමිණීම ආදී සීමාකාරී සාධක රාශියක් ප්‍රධාන වශයෙන් මෙයට බලපා ඇති බව. | ඉකුත් වර්ෂවල ධාරිතාව හා පවතින සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂයේ නිෂ්පාදන සැලසුම් සකස් කළ යුතු අතර අදාල නිෂ්පාදන ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්යසාධන වර්ධනයක් පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය 127 ක් වූයෙන් වැඩපත් 88 ක ප්‍රමාණයක් එනම් සියයට 41 ක් හා නව නිෂ්පාදනාගාරයේ නව නිෂ්පාදන 12 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 1228 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 423 ක් වූයෙන් වැඩපත් 805 ක ප්‍රමාණයක් එනම් සියයට 66 ක් නිමකර ගැනීමට නොහැකිවී තිබීම අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක කරා ළඟා නොවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | | |
| (ඈ) | සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | ඒ ඒ අංශ සඳහා කාර්ය සාධන දර්ශක පිහිටුවා එම කාර්ය සාධන ඇගයීම සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සංස්ථාවේ එක් එක් අංශයන්හි ක්‍රියාවලීන්හි කාර්යසාධනය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය. |
| (ඉ) | 1969 මැයි 11 දිනැති අංක 14853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු 07 අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අරමුණ පිළිබඳව වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අවධානය යොමු වී ඇති බව හා සංස්ථාව මගින් හෝ ඒකාබද්ධ ව්‍යාපෘති ලෙස ගව පට්ටි පවත්වාගෙන යාමට අදහස් කරන බව. නිකවැරටිය ඔසු උයනේ මීමැසි ජනපද 20ක් ස්ථාපිත කිරීමටත්, කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවෝද්‍යා මිතුරු සංසදය සමග ඒකාබද්ධව මීමැසි ජනපද 30ක් ස්ථාපිත කිරීමටත් කටයුතු කරමින් පවතින බව. | සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හෝ ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල වන සේ අරමුණු සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලසුම අනුව වාර්ෂික විනෝද චාරිකාව සඳහා රු.1,800,000 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2020 හා 2021 වර්ෂවල ප්‍රතිපාදනද ඉතිරිව පවතින බවට වූ සාවද්‍ය කරුණු දැක්වීමක් මත පදනම්ව, 2022 පෙබරවාරි 10 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අංක 14143 මගින් 2022 වාර්ෂික විනෝද චාරිකාවට රු.4,500,000 ක වියදම් දැරීමට අනුමැතිය ලබා දී තිබුණි. නමුත් 2021 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් රු.20,152,134 ක අලාභයක් හා රු.17,728,950 ක ශුද්ධ අලාභයක් ලබා | සෑම වර්ෂයකම අයවැය තුළ මානව සම්පත් අංශයට වාර්ෂික විනෝද චාරිකාව වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරන බව. රටතුල පැවති Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 හා 2021 වර්ෂවල චාරිකාව සංවිධානය කිරීමට නොහැකි වූ බව. ඒ අනුව 2022 වර්ෂයේදී පසුගිය වසරවල අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන අදාළ කරගනිමින් චාරිකාව සංවිධානය කළ බව. | යම් මුදල් වර්ෂයක වියදම් සඳහා අයවැයෙන් වෙන්කරන ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහා භාවිතා කළ නොහැකිය. මෙහෙයුම් අලාභ ලබමින් පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන වියදම් පාලනය පිළිබඳව මනා අධීක්ෂණයක් හා සංයමයක් ද මූල්‍ය විනයක්ද පවත්වාගත යුතුය. සැපයුම්කරුවන්ගෙන් මුදල් හා ද්‍රව්‍යාධාර ලබානොගත් බවටත් අක්‍රමිකතාවයක් හා වංචාවක් සිදු නොවූ බවටත් තහවුරු කර |

| | | |
|---|---|---|
| තිබියදී රාජ්‍ය වියදම් පාලනය පිළිබඳව මනා අධීක්ෂණයක් හා සංයමයක් පවත්වාගත යුතු වුවද එම වාරිකාව සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සීමාවද  සියයට 147 ක් ඉක්මවා රු.4,442,861 ක් සංස්ථාවේ අරමුදල් වලින් වැය කිරීමේදී එහි අයහපත් බලපෑම පිළිබඳ නිසි අවධානයක් යොමු කර නොතිබුණි. තවද මේ වෙනුවෙන් වැයකිරීම සඳහා සංස්ථාවට ඖෂධ, භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන්ගෙන් මුදල් හා  ද්‍රව්‍යාධාර ලබාගත් බවට සාක්ෂි අනුව තහවුරු වූ නමුත් එම මුදල් කිසිවක්  විනෝද වාරිකාවට වැයකළ බව හෝ අක්‍රමිකතාවයක් හා වංචාවක් සිදු නොවූ බව හෝ තහවුරු කෙරෙන  ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018, 2020 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. 75,500,000 කින් රු. 30,921,906 ක් හෙවත් සියයට 41ක් 2023 ජුනි 30 දින වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි. | මේවන විට පවතින භාණ්ඩාගාර ප්‍රතිපාදන ශේෂය රස බෙහෙත් ගබඩාව ඉදිකිරීමට ලබා දී ඇති ප්‍රතිපාදන සහ විදුලි ජනක යන්ත්‍රයක් ලබා දීමට ලබා දී ඇති ප්‍රතිපාදන බව. රස බෙහෙත් ගබඩාව ඉදිකිරීම සම්බන්ධව අදාල කොන්ත්‍රාත් ආයතනය සමග සාකච්ඡා කරමින් පවතින අතර විදුලි ජනක යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව. | සංස්ථාවේ අරමුණු ඉටුකර ගනිමින් රටේ සංවර්ධනයට දායක විය හැකි අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ ව්‍යාපෘති පමණක් සැලසුම් කර එම සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පමණක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගත යුතුය. ඉතිරිව පවතින ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළ ව්‍යාපෘති නැවත සමාලෝචනය කර අත්‍යවශ්‍ය කාර්යයන් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී නව ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවිකර ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.මිලියන. 5 ක් ලබාදී තිබුණද, 2023 අගෝස්තු 23 වන විටත් එම කාර්යය සඳහා මුදල් උපයෝජනය කර නොතිබුණි. | 2021, 2022 වර්ෂවල අවස්ථා දෙකකදී විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන පිරිනැමීම සිදුකළ නමුත් වසංගත රෝග හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය තුළ පැනනැගි විදේශ විනිමය ගැටලු නිසා සැපයුම්කරුවන් විසින් සැපයුම් කටයුතු සිදු නොකළ බව. මේවන විට නැවත වතාවක් | විදුලි ජනක යන්ත්‍රය මිලදී ගැනීමට කටයුතු කර 2023 වර්ෂයේ ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | 200KVA ධාරිතාවයෙන් යුතු විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර 2023 දෙසැම්බර් 31 දිනට පෙර විදුලි ජනක යන්ත්‍රය මිලදී ගැනීමට කටයුතු කරන බව. | |

**3.4 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් අවස්ථා 111 කදී රු. 823,790 ක් වටිනා ඖෂධ නොමිලේ නිකුත් කර ඒවායේ පිරිවැය රු. 605,600 ක් පරිත්‍යාග ලෙස විකුණුම් හා බෙදා හැරීම් වියදම් යටතේ දක්වා තිබුණි. තවද 2019 ජුලි 08 දිනැති අංක 13406 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව විෂය භාර අමාත්‍යවරයාගේ ඉල්ලීමකට හැර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගත් රු.10,000කට වැඩි පරිත්‍යාග වලට අදාළ මුදල් අදාළ නිලධාරින්ගෙන් අය කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ අවස්ථා 14 කදී එම තීරණයෙන් බැහැරව සිදු කර තිබුණු රු. 10,000 ක් ඉක්මවූ රු. 681,680 ක පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(i) ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තීරණ අංක 14192 අනුව 2023 වර්ෂයේ සිට කටයුතු සිදු කරමින් පවතින බව. 2019 ජුලි 08 දිනැති අංක 13406 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කටයුතු කිරිම සඳහා නැවත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | නිසි පරිදි සැලසුම් කළ අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් වෙනුවෙන් හැර විකිණීම සඳහා නිෂ්පාදිත ඖෂධ නොමිලේ නිකුත් නොකළ යුතුය. නිලධාරීන්ගේ පුද්ගලික තීරණ මත පුණ්‍ය කටයුතු හා පරිත්‍යාග සඳහා සංස්ථාවේ සම්පත් භාවිතා නොකළ යුතුය. විකිණීමෙන් හැර වෙනත් ඕනෑම මාර්ගයකින් සිදු කෙරෙන ඖෂධ බැහැර කිරීම් සම්බන්ධයෙන් සිදුකළ යුතු නිසි ක්‍රමවේදයක් හඳුන්වාදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. එවැනි බැහැර කිරීම්වලට අදාළ නිර්දේශයන්, අනුමැතීන් හා අධීක්ෂණයන් නිශ්චිතව දැක්වෙන පරිදි ලේඛන හා පොත්පත් පවත්වා ගත යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් ද පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් 2023 වර්ෂයට අදාළ වන පරිදි සකස් කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

(ආ) 2022 වර්ෂයේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වියළි හා රස ඖෂධ වර්ග 76කින් කිලෝග්‍රෑම් 91,775ක් මාස 09ක් සඳහා සහ තෙල් හා දියර වර්ග 06කින් කිලෝග්‍රෑම් 107,287ක් මාස 06 ක් සඳහා ආනයනය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු මිලෙන් ප්‍රතිශතයක් සඳහන් කරමින් පමණක් ලංසු සුරක්ෂණ තැන්පතු ඉල්ලා සිටීම තදින්ම අධෛර්යමත් කළයුතු වුවත්, යථොක්ත ප්‍රසම්පාදනයේදී ලංසු ලේඛනවල උපදෙස් අනුව මුළු ලංසු මිලෙන් සියයට 5ක ලංසු සුරක්ෂණ තැබිය යුතු බවට දැක්වීම මගින් උක්ත ඖෂධ වර්ග 82 න් කොටසක් හෝ සාපේක්ෂ අඩුමිලට සැපයීමට ඉදිරිපත් විය හැකිව තිබුණු සුළු පරිමාණ සැපයුම් කරුවන්ට ප්‍රසම්පාදනය සඳහා සහභාගී වීමට තිබුණු අවස්ථාව වලක්වා තිබුණි. | 2022 වර්ෂයේදී අනුගමනය කරන ලද ප්‍රසම්පාදන තීරණයන් අනුව හා පූර්වාදර්ශ මත පදනම්ව මිල ගණන් කැඳවීමේදී මුළු ලංසු වටිනාකමෙන් සියයට 5 ක ලංසු සුරක්ෂණයක් තැබීමට දැනුම් දීම් සිදු කර ඒ අනුව කටයුතු කළද, වර්තමාන ප්‍රසම්පාදන කමිටුව නිෂ්පාදන අවශ්‍යතාවයන් අනුව අවස්ථා කිහිපයකදී වෙන් වෙන් වශයෙන් මිල ගණන් කැඳවීමටත්, ලංසු සුරක්ෂණ ඇප සඳහා ප්‍රතිශතයක් දැක්වීමකින් තොරව සැපයුම් වටිනාකම පදනම් කරගෙන ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමටත් විධිවිධාන සලස්වා ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | ප්‍රසම්පාදන දැන්වීම මගින් විදේශීය සැපයුම්කරුවන් නිෂ්පාදකයන් හෝ ඔවුන්ගේ බලය පැවරූ දේශීය නියෝජිතයන් වෙතින් මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවා තිබුණද, ඊට පටහැනිව හා ලංසු සුරක්ෂණද රහිතව දේශීය ආයතනයක මිළ ගණන් පිළිගෙන තිබුණි. සම්මත ලංසු ලේඛන වල විදේශීය සැපයුම්කරුවන් CIF මිලට ඇ.එ.ඩොලර් වලිනුත් දේශීය සැපයුම්කරුවන් සංස්ථාව දක්වා සැපයීමේ මිලට ශ්‍රී ලංකා රුපියල් (LKR) වලිනුත් මිල ගණන් ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද යථොක්ත දේශීය ආයතනය සංස්ථාව දක්වා සැපයීමට ඇ.එ.ඩොලර් වලින් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. ලංසු කැඳවීමේ ලේඛන වල නිශ්චය කොට ඇති කරුණු වලට පරිභාහිර බැවින් එම ලංසුව ප්‍රතික්ෂේප කල යුතු වුවත් | මිල ගණන් ඉදිරිපත් වූ ආයතන 02 වන දේශීය ආයතනය හා විදේශීය ආයතනය මිල ගණන් විවෘත වන දිනට ලංසු ඇපය ඉදිරිපත්කර නොතිබුණද රටේ පැවති විරෝධතා හා අරගල හේතුවෙන් ආයුර්වේද ඖෂධ සංස්ථාව රාජකාරී කටයුතු අරඹන ලද 2022 මැයි 17 වන දින අදාළ ලංසු ඇප සැපයුම් අංශය වෙත ලබාදී ඇති බව. තාක්ෂණික ඇගයීම් කමිටුව අවසන් ගැණුම් මිල රුපියල් අගය සමග සැසඳීම සඳහා සැපයුම්කරුවන්ගේ ඩොලර් වටිනාකම 2022 මැයි 17 පැවති අගයට රුපියල් අගයට පරිවර්ථනය කල බව. දේශිය සැපයුම්කරුවන් සඳහා ඖෂධ වටිනාකම රුපියල් වලින් සඳහන් කිරීමට අවස්ථාව ලබාදී තිබුණද දේශිය සැපයුම්කරු ඩොලර් වලින් ඉදිරිපත්කර ඇති බව. 2022 ජුනි 17 වන දින පැවති ප්‍රසම්පාදන මණ්ඩලයට ඉදිරිපත් කරන ලද මිල | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික විය යුතුය . |

| | | | |
|---|---|---|---|
| | තාර්කික පදනමකින් හා විනිවිදභාවයකින් තොරව සිදු කළ ඇගයීම් ක්‍රියාවලියක් හරහා ඇ.එ.ඩොලර් 329,125.3 ක වියළි ඖෂධ හා තෙල් හා දියර වර්ග 36ක කිලෝ ග්‍රෑම් 35,157.5 ක් ආනයනය කිරීමට එම ආයතනයට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික විය යුතු ඇගයීමේ හා තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටියෙහි විනිවිදභාවය සහ නිත්‍යභාවය තහවුරු කිරිම සිදු වී නොතිබුණ බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව යථෝක්ත දේශීය ආයතනය සම්බන්ධයෙන් විශේෂ ඇල්මකින් කටයුතු කර තිබුණු බවත් නිරික්ෂණය විය. | ගණන් තත්ත්වයන් දෙකක් යටතේ පවතින බැවින් නිවැරදි තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුවට උපදෙස් ලබාදුන් බව. සංශෝධිත තාක්ෂණික ඇගයිම් කමිටු වාර්තාව අනුව ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව. | |
| (ඇ) | ආසියානු රටවල පවතින සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඒකාබද්ධ කරමින් දේශීය ජනතාවට මෙන්ම විදේශීකයන්ට ස්වකැමැත්තෙන් ප්‍රතිකාර සහ ඖෂධ ලබා ගැනීමට හැකිවන පරිදි අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇතිකිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ව්‍යාපෘති සැලසුම හා ඇස්තමේන්තු සැකසිම සඳහා මිල ගණන් කැඳවීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවිම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනයට යොමුවීමේ කොන්දේසි (Terms of Reference) (TOR) පිළියෙල කර නොතිබුණි. තවද 3.14.3 මාර්ගෝපදේශය ප්‍රකාරව උපදේශන සේවාවල මුළු පිරිවැය රු.මිලියන 10 ක් නොඉක්මවන්නේ නම් රාජ්‍ය ආයතන සඳහා උපදේශන සේවාව ප්‍රදානය කිරීමට හැකියාව තිබියදීත් සභාපති විසින් ප්‍රසම්පාදන මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව වාස්තු විද්‍යාඥ කටයුතු වල නියුතු පුද්ගලයකු වෙත | 2021 වර්ෂයේදී නාවින්න ආයුර්වේද කලාපය මහජනතාවට විවෘත කලාපයක් ලෙස ආකර්ෂනීයව සකස් කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කිහිපයක් පැවැත්වූ බව. සැලසුම හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලීමක් කරන ලද බව COVID 19 වසංගත තත්වය හා එම ආයතනය මුහුණ දී ඇති විවිධ කරුණු දක්වමින් අප විසින් ඉල්ලා සිටින ලද කාර්ය ප්‍රමාද කළ බැවින් වෘත්තීය සුදුසුකම්ලත් ආයතන වෙතින් හා තැනැත්තන් වෙතින් විධිමත්ව සේවා ගාස්තු විමසීමට කටයුතු කර සැලසුම හා ඇස්තමේන්තුව සකස් කිරීමට එම ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවිම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුළු ඉදිකිරීමේ පිරිවැයෙන් සියයට 5ක් ගෙවීමට යටත්ව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | | |
| (ii) | කිසියම් ලංසුවක වලංගු හා ප්‍රතිචාරාත්මකභාවය පිළිගනු ලැබීමට අවශ්‍ය වන්නා වූ කොන්දේසි ලංසු කැඳවීමේ ලේඛනවල පැහැදිලිව නිශ්චය කිරීමට තාක්ෂණික හා මූල්‍ය යෝජනා සඳහා සම්මත ලේඛන ලබා දිය යුතු නමුත් උපදේශන සේවා සපයන ආයතන 11ක් වෙත මිල ගණන් කැඳවීමේ දැන්වීම පමණක් යොමු කර මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව උපදේශක ආයතන 04ක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 මාර්ගෝපදේශය ප්‍රකාරව දිනුම් ලංසුව තෝරා ගැනීම සඳහා සාධාරණ උපමානයන් සහ ක්‍රමවේදයන් විභව ලංසු කරුවන් වෙත සංනිවේදනය කිරීමට කටයුතු නොකර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තම අභිමතය පරිදි තීරණ කළ ලංසු ඇගයීමේ උපමානයන් 05ක් අනුව ලංසු ඇගයීම කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික වියයුතු ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික වී නොතිබුණි. | උපදේශන ආයතන 11ක් වෙතින් සේවා ගාස්තු කැඳවා ඉදිරිපත් වූ මිල ගණන් 4ක් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද බව. මෙම මිල ගණන් කැඳවීමේදී සංකල්ප පත්‍රිකාවට ඇතුලත් කරන ලද ව්‍යාපෘති කාර්යයන් පිළිබඳව තොරතුරු අදාල දැන්වීමේ ඇතුලත් කරන ලද අතර වැඩිදුර තොරතුරු විමසීම් කළ ආයතන වෙත ඒ සම්බන්ධ තොරතුරු හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීමටද අවස්ථාව ලබා දෙන ලද බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික විය යුතුය . |
| (iii) | රු. මි. 100 ක් වූ මුළු ව්‍යාපෘති පිරිවැයෙන් රු.මි. 40ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින්ද රු.මිලියන 60ක් සංස්ථාවෙන්ද දැරීමට යෝජනා කර තිබුණද, ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය හා ප්‍රතිපාදන ලබා දී නොතිබුණු අතර සංස්ථා දායකත්වය සඳහාද මුදල් වෙන්කර නොතිබුණි. 2023 සැප්තැම්බර් 30 දින වන විටත් වැඩ ආරම්භ කිරීමට කිසිදු සූදානමක් නොතිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හෝ පිළියෙල නොකර රජයේ උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව ව්‍යාපෘති වාර්තාව සකස්කර රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කර මහා භාණ්ඩාගාරය වෙත යොමුකර ඒ පිළිබඳව සාකච්ඡා කළද අදාළ ප්‍රතිපාදන නොලැබුණු බව. ඉදිකිරීමේ පිරිවැය රුපියල් මිලියන 100ක් හා අනෙකුත් පිරිවැයද ඇතුළත් කර 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන අයවැය යෝජනාවක් ඉදිරිපත් කළද අනුමැතිය හෝ ප්‍රතිපාදන ලබාදී නොමැති බව හා 2024 වර්ෂයේ ප්‍රාග්ධන අයවැය යෝජනා යටතේද මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කර ඇති බව. | අනුමැතිය හා ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගත යුතුය. |

අවිධිමත්ව සේවයේ යොදවාගත් සැලසුම් ශිල්පියකුට රු.මිලියන 02 ක් ගෙවා තිබුණි.

(ඇ) ඖෂධ සංස්ථාව නිෂ්පාදනය කරන ආයුර්වේද ඖෂධ බෙදා හැරීම හා ප්‍රධාන නගරවල ඖෂධ අලෙවිසැල් පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී අලෙවි නියෝජිතයින් පත්කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | ජාතික වශයෙන් ප්‍රචාරය කළ යුතු මෙම ප්‍රසම්පාදනයට අදාළ දැන්වීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවට අදාළ ඉල්ලුම්පත් කැඳවීම සංස්ථා වෙබ් අඩවියේ සහ ෆේස්බුක් ගිණුමේ දැන්වීම් පල කිරිම මගින් පමණක් සිදු කරතිබුණි. | පළමු අදියරේදී සීමිත අලෙවි නියෝජිත පිරිසක් තෝරා ගන්නා බැවින් පිරිවැය අවම වන පරිදි සංස්ථා වෙබ් අඩවියේ සහ ෆේස්බුක් පිටුවේ ප්‍රචාරය කර අදාල අයදුම්පත් කැඳවීම සිදු කර ඇති බව. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 14226 හි ලබා දි ඇති උපදෙස් පරිදි කටයුතු සිදුකර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 ජූලි 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 14226 ප්‍රකාරව අලෙවි නියෝජිතයන් විසින් රු.700,000ක බැංකු ඇපකරයක් සහ රු.300,000ක ණය රක්ෂිත අරමුදලක් ජංගම ගිණුමක තැන්පත් කළ යුතු වුවද සංස්ථාව එම විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නියෝජිතයින් 15 දෙනෙකුට නියෝජිතභාවය පිරිනමා තිබුණි. | ඇතැම් අලෙවි නියෝජිතයින් රුපියල් 300,000 ක ණය ආරක්ෂිත අරමුදල පමණක් ඉදිරිපත් කර නියෝජිතධුරයේ කටයුතු කරන අවස්ථා පවතින බව. ආරක්ෂිත අරමුදල් සීමාව ඉක්මවන අවස්ථා වලදී අත්පිට මිලදී ගැනීම් පමණක් සිදු කරන බව. කෙසේ නමුත් ඉලක්කගත අලෙවිය ලඟා කර ගැනීම සඳහා පූර්ණ වශයෙන් කොන්දේසි සපුරාලීම අවශ්‍ය වන බැවින් ඒ පිළිබඳව විශේෂ අවධානය යොමුකර කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කොන්ත්‍රාත් ගිවිසුම් වලට පටහැනිව කටයුතු නොකළ යුතුය. |
| (iii) | රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සඳහා විකුණුම් මිලට එකතු කරන ලද වට්ටම් සීමාවද ඉක්මවා පෞද්ගලික අංශයේ අලෙවි නියෝජිතයින්ට රු.500,000කට වැඩි මිලදී ගැනීම් සඳහා සියයට 33 සිට සියයට 40ක් දක්වා වට්ටම් ලබා දීම නිසා සියයට 25ක් වූ | දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් විසින් සංස්ථා නිෂ්පාදන ප්‍රවාහනය, බෙදාහැරීම, ප්‍රවර්ධනය හා අලෙවියට අදාල සියලු මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන බැවින් සියයට 40 දක්වා වට්ටම් ප්‍රතිශතයක් ක්‍රියාත්මක කළ බව. රාජ්‍ය අංශය සඳහා හා සියයට 30 ඉක්ම වූ වට්ටමක් සහිතව එම නිෂ්පාදන අදාළ රෝහල්, | සංස්ථාවේ ලාභදායීත්වයට හා රජයේ මුදල්වලට හානි සිදුවන ක්‍රියාමාර්ග අධෛර්යමත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සංස්ථාවේ ලාභ ආන්තිකයෙන් සියයට 03ක්, සියයට 05ක්, සියයට 07ක් හෝ සියයට 10ක් ආදි වශයෙන් සියයට 15ක් දක්වා අඩුකර ගෙන තිබුණි. ඒ අනුව සාමාන්‍ය පාරිභෝගික ජනතාවට ලබා දිය හැකිව තිබුණු මිල සහනයක් පෞද්ගලික අලෙවි නියෝජිතයින් වෙත ලබා දීමටත් රාජ්‍ය ආයතනවලට එම අවස්ථාව ලබා නොදීමටත් සංස්ථාව කටයුතු කර තිබුණි. | බෙහෙත්ශාලා වෙත ප්‍රවාහනය කර දීමටද කටයුතු කරන බව. 2023 වර්ෂයේදී පත් කරනු ලැබූ ස්ථානීය හා මාර්ගගත අලෙවි නියෝජිතයින් වෙත ලබාදෙන උපරිම වට්ටම් ප්‍රතිශතය සියයට 27 ක් දක්වා අඩුකර ඇති බව. | |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශයට පටහැනිව ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රමිතිය නොසලකා හැරීම හා ප්‍රමිතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීම මගින් ඇතැම් සැපයුම්කරුවන්ට වාසිදායක වන ආකාරයට ප්‍රසම්පාදන කටයුතු කර තිබුණු අවස්ථා පැවැති බව නිරීක්ෂණය විය. | | |
| (i) පිළිගත් ආයතනයක් වෙත යොමුකර ප්‍රමිතිය සම්බන්ධයෙන්වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස රු.2,840,000ක්වූ රසදිය (අශුද්ධ) කිලෝග්‍රෑම්100ක් මිලදී ගෙන තිබුණි. | රසදිය ලබා ගැනීමේදී මෙම සංස්ථාව විසින් වෛද්‍යවරුන්ගේ නිර්දේශ මත පමණක් පදනම්ව මිලදී ගැනීම සිදු වන බව. රසදිය සම්බන්ධ රසායනාගාර පරීක්ෂාව සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් ඒ සඳහා සංස්ථාවේ අදාළ රසායනාගාර පහසුකම් නොමැති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 5.6.3 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) රසායනාගාර පරීක්ෂණ වාර්තා අනුව ප්‍රමිතියෙන් බැහැර බවට තීරණය වීමෙන් පසුව සංස්ථාවේ ආයුර්වේද වෛද්‍යවරයකුගේ නිර්දේශයක් ලබාගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාස වල රු.1,462,500 කට මී පැණි කිලෝග්‍රෑම් 1500ක්, රු.3,784,500කට තල තෙල් කිලෝග්‍රෑම් 15,036ක් හා රු.2,810,475කට මී තෙල් කිලෝග්‍රෑම් 3,507ක් මිලදී ගෙන තිබුණි. | මීපැණි, තෙල් වර්ග මිලදී ගැනීමට අදාල සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී නියැදි ලබා ගෙන එම නියැදි රසායනාගාරය වෙත යොමුකර වාර්තා ලබා ගැනීමටත් වෛද්‍යවරුන් වෙත යොමුකර වර්ණය, සුවඳ ආදී ඔවුන් විසින් සැලකිල්ලට භාජනය කරනු ලබන වෙනත් කරුණු ද සැලකිල්ලට ගෙන වෛද්‍යවරුන්ගේ වාර්තා ලබා ගැනීමටත් කටයුතු කරන බව. මීපැණි හා තෙල් වර්ග ආදී දියරමය ස්වාභාවයේ අමුද්‍රව්‍ය වලට අදාලව රසායනාගාර වාර්තා සහ | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික විය යුතුය . |

| | | | |
|---|---|---|---|
| | | වෛද්‍යවරුන්ගේ වාර්තා සැසඳීමක් සිදු නොවන අවස්ථා පවතී. එවැනි අවස්ථා වලදී දෙපාර්ශවය විසින් සාකච්ඡා කර අමුද්‍රව්‍ය ගුණත්වය හා නිෂ්පාදන කටයුතු සඳහා පවත්නා අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන වෛද්‍යවරුන්ගේ නිර්දේශය මත අදාල මිලදී ගැනීම සිදු කිරීමට කටයුතු කරන අවස්ථා පවතින බව. | |
| (ඊ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06කදී දඹාන ආදිවාසි ගම්මාන සහ මහියංගණය අවට ප්‍රදේශ වලට ගොස් ප්‍රසම්පාදන කටයුතු වලින් බැහැරව වියළි ඖෂධ මිලදී ගැනීම සඳහා එකතුව රු. 6,000,000 ක අත්තිකාරම් ලබා දී තිබුණි. ඒ අනුව ලිඛිත ඉල්ලීම් සහ වියදම් ඇස්තමේන්තු නොමැතිව වරකට 5ත් 12ත් අතර නිලධාරීන් සංඛ්‍යාවකට රු.100,000 බැගින් අත්තිකාරම් වවුචර පිළියෙල කර, එම වවුචරවලට අදාළ සියලු අත්තිකාරම් මුදල් සහකාර අතට ලබා ගෙන, සභාපති ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු සමඟ ගොස් දඹාන ආදිවාසින්ගෙන්ද එම ප්‍රදේශයේ වෙනත් සැපයුම් කරුවෙකුගෙන්ද අත්පිට මුදලට මිලදී ගැණීම් සිදු කර තිබුණි. තවද එක් එක් කළමනාකරුවන් වෙන වෙනම අත්තිකාරම් පියවීමට කටයුතු නොකර එක් ජර්නල් වවුචරයකින් වගකිවයුතු නිලධාරියකුගේ අනුමැතියක්ද නොමැතිව අදාළ අත්තිකාරම් පියවා තිබුණි. | අධ්‍යක්ෂක මණ්ඩල තිරණ අංක 13936 යටතේ මහියංගනය අවට හා දඹාන අදීවාසින් විසින් එක් රැස්කර ඇති ඖෂධ මිලදීගත් බව. ඒ අනුව මිලදී ගැනීම් කටයුතු සිදු කිරීමේදී ඊට අදාල නිලධාරීන් සහභාගී වූ අතර දඹාන ආදී වාසීන් වෙතින් අත්පිට මුදලට මිලදී ගැනීම් සිදු කිරීමට සිදු වූ නිසා මෙලෙස නිළධාරීන් කිහිප දෙනෙකු වෙත අත්තිකාරම් ලබා දී මිලදී ගැනීම් කටයුතු සිදු කර ඇති බව. එසේම පසු කාලීනව අනුමත කර ඇති අත්තිකාරම් මුදල මුදල් අයකැමි වෙත ලබා දී එම ප්‍රමාණයට අදාල මාර්ගස්ථ මුදල් රක්ෂණයක් ලබා ගෙන ඔසු අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බව. | නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීම සම්බන්ධයෙන් පවතින රෙගුලාසිවලට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ඖෂධ මිලදී ගැනීම් සිදුකර වංචා හා වැරදි සිදුවීමේ ඉඩකඩ වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගිමේ අරමුණින් රු.45,725,759 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.12,144,400 ක් වැය කර ඉදිකිරීම්වලින් | මෙම රස බෙහෙත් ගබඩාවේ ඉදි කිරීම් සිදු කිරීම සඳහා පිරිවැය අවම වන පරිදි කටයුතු කිරීමට සහ ගොඩනැගිලි ඉඩකඩ උපරිම ලෙස භාවිතා කිරීමට හැකිවන පිරිදි සැලසුමේ සිදු කලයුතු සංශෝධන සම්බන්ධව ඉදිකිරීම් උපදේශන ආයතනය වන රාජ්‍ය | ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 30 ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2023 සැප්තැම්බර් 30 වන විට වසර 05 ක් ඉක්මවා තිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතිය වෙනුවෙන් එතෙක් කළ වියදම අනාර්ථික බවට පත්ව තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ පිරිවැය රු. 58,940,280 ක් දක්වා රු. 25,431,163 කින් එනම් සියයට 75.89 කින් ඉහල ගොස් තිබුණි. | ඉංජිනේරු සංස්ථාව සමග සාකච්ඡා කරන ලද බව හා ඒ අනුව මෙම ආයතනය සංශෝධිත සැලැස්මක් ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡා කර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 375ක් වූවද එදිනට තත්‍ය කාර්යමණ්ඩලය 308ක්වූ යෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 18කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 67ක් විය. | මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 40 ක් ඇති බවත්, මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය හා ජාතික මැතිවරණ කාර්යාලයේ අවසරය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය වර්තමානයට ගැලපෙන සේ සමාලෝචනය කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා ගණ 09ක් යටතේ සංස්ථාව සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර තිබුණු නමුත් එම සේවා ගණ යටතට අයත් තනතුරු වලට බඳවා ගන්නා ලද සියළුම නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමකින් තොරව සේවයේ ස්ථිර කර තිබුණි. තවද, සේවයේ ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමට හා සේවය ස්ථිර කල බවට පෞද්ගලික ලිපිගොනුවට පිටපතක් සහිතව ලිපියක් නිකුත් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා 2023 වර්ෂයේදී කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා අවසන් කර ඇති අතර කළමනාකාර සහකාර සේවා ගණය සහ ඊට ඉහල සේවා ගණ සඳහා 2023 නොවැම්බර් මස අවසාන වන විට විභාග පැවැත්වීමට විධිවිධාන යොදා ඇති බව. සේවකයින් ස්ථිර කිරීමේදී කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කිරීම සැලකිල්ලට ගන්නා බව හා සේවය ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමත් පෞද්ගලික ලිපි ගොණුවට පිටපතක් සහිතව සේවය ස්ථිර කිරීමේ ලිපි නිකුත් කිරීමත් ආරම්භ කර ඇති බව. | අදාළ බඳවාගැනීමේ පටිපාටි අනුව කාර්යක්‍ෂමතා කඩඉම් විභාග නිසි පරිදි පැවැත්වීමට හා සේවයේ ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමට හා සේවය ස්ථිර කල බවට පෞද්ගලික ලිපිගොනුවට පිටපතක් සහිතව ලිපියක් නිකුත් කිරිමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය අනුව හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුළත රාජ්‍ය සංස්ථා වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට දින 192 ක් ගතවී තිබුණි. | 2022 වර්ෂය සඳහා අවසාන ගිණුම් සකස් කර එම ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනලද අතර අවස්ථා කිහිපයකදී සංශෝධනය කිරීමට සිදු වූ බව. මේ වන විට 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව කෙටුම්පත් කර ඇති බව. වාර්ෂික විගණන වාර්තාව ලැබීමෙන් පසු වාර්ෂික වාර්තාව සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන බව. | යම් මුදල් වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුළත රාජ්‍ය සංස්ථා වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන සහිත රුපියල් මිලියන 200 ක්වූ ප්‍රාග්ධන ක්‍රියාකාරම් 10ක් පමණක් ඇතුළත් කර තිබුණු නමුත් යථොක්ත ප්‍රාග්ධන ක්‍රියාකාරකම් කිසිවක් ඉටුකර නොතිබුණි. සංස්ථාවේ අරමුදලින් ඉටුකළ ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වලට වැය කළ රුපියල් මිලියන 63.20 ක් හා දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ආමාත්‍යාංශය මගින් නිකවැරටිය හා අඹන්පොළ ඔසු උයන්වල සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදී තිබූ රුපියල් මිලියන 2 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව සැලසුම් කළ වැඩසටහන් හා ව්‍යාපෘති 36 කින් 19 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඉන් 17ක් එනම් සියයට 47 ක් ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් ලබා කරගෙන නොතිබුණි. | 2022 වර්ෂය සඳහා ප්‍රාග්ධන අයවැය සකස් කර අමාත්‍යාංශ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යාංශය වෙත යොමු කළද අදාල ප්‍රතිපාදන නොලැබුණු බව.සංස්ථාවේ පවතින ප්‍රතිපාදන තත්වය හා කාර්යන්හි ප්‍රමුඛතාවය සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමට පියවර ගත් බව. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ලද රුපියල් 2,000,000 කින් නිකවැරටිය හා අඹන්පොල ඔසු උයන්වල තෝරාගත් සංවර්ධන කටයුතු සිදු කල බව. ඉහත ප්‍රතිපාදන කඩිනම් වැඩසටහනක් යටතේ ලද අතිරේක ප්‍රතිපාදන බැවින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව නොමැති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හැකිතාක් යථාර්තවාදීව පිළියෙල කළ යුතු අතර එහි ඇතුළත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් වැඩි අවධානයකින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (අ), (ආ) සහ (ඇ) ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා දැනට සිටින කාර්ය මණ්ඩලය, අයවැය ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, කාල රාමුව හා අපේක්ෂිත නිමවුම ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කරන බව . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.3** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11ක පුනරාවර්තන වියදම් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා තත්‍ය වියදම් දරා තිබුණු අතර එය සියයට 23 සිට සියයට 161 දක්වා පරාසයක විහිදී තිබුණි. තවද ප්‍රාග්ධන වැය විෂයයක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා තත්‍ය වියදම් දරා තිබුණු අතර එය සියයට 61ක් වී තිබුණි. නව ශාකසාර නිෂ්පාදනාගාරයට අදාළව අයවැය ප්‍රතිපාදනය රු.250,000ක්ව තිබියදී තත්‍ය වියදම් රු.4,071,312 ක් වීමෙන් එම ප්‍රතිපාදනය නිසිපරිදි තාත්විකව හා විචක්ෂණශීලව සමාලෝචනය නොකර ඇස්තමේතුකර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛණය ඵලදායි මූල්‍ය පාලනකාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | සියලුම අංශයන්ගෙන් තොරතුරු ලබා ගෙන අයවැය වාර්තා පිළියෙල කරනු ලබන අතර කළමනාකාරීත්වය විසින් ගනු ලබන තීන්දු තීරණ මත ඒ ඒ අවස්ථා වලදී අවශ්‍යතාවය සලකා බලා අදාල අනුමැතිය යටතේ යම් යම් වියදම් සිදු කරනු ලබයි. ඒ අනුව අයවැය ප්‍රතිපාදන ඉක්මවා ඇති බව. | අයවැය ලේඛණය ඵලදායි මූල්‍ය පාලනකාරකයක් ලෙස යොදා ගත යුතුය. |
| (ආ) | සංස්ථාවේ ආදායම් ඇස්තමේන්තුව හා වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී ආදායම්, අයහාර වියදම් හා ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය සඳහා ප්‍රමිතිකරණය කළ සම්මත සංකේත අංක සහ කාර්යය විස්තර භාවිතා කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදි වර්ගීකරණයක් සහිතව ආදායම් වියදම් ගිණුම්ගත කිරීම සඳහා සම්මත සංකේත අංක සහ කාර්යය විස්තර භාවිතා කළ යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබද එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව . දරිද්‍රතාවයෙන් තොර වීම. කුසගින්න තුරන් කිරීම. නීරෝගී බව හා යහපැවැත්ම, සුනිසි මෙහෙවර හා ආර්ථික වර්ධනය වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය යන කරුණු පිළිබඳ 2023-2027 සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අවධානයට යොමු කළ බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. . |